## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශාස්ත්‍ර පීඨය

### සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (දෑ අවුරුදු) 2017/2019 සහ සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධි පරීක්ෂණය (එක් අවුරුදු) 2017/2018

### MAS 604 – ග්‍රාමීය සමාජ පිළිබඳ සමාජ විද්‍යාව

**ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න**

**කාලය : පැ තුනයි (03)**

---

1. 'ග්‍රාමීයත්වය සහ ගැමි සමාජය යනු මානව සමාජයේ වෙනම කොටසක්ය.' 'එරික් වුල්ෆ්ගේ "Peasant" යන කෘතිය ඇසුරින් සාකච්ඡා කරන්න.

2. සාම්ප්‍රදායික සිංහල සමාජය තුළ ගැමි නිෂ්පාදන සහ සමාජ සම්බන්ධතා සංවිධානය වී තිබුණු ආකාරය කවරේද යන්න තිලක් හෙට්ටිආරච්චිගේ "The Sinhala Peasant in a Changing Society" යන ග්‍රන්ථය ඇසුරින් විභාග කරන්න.

3. යටත් විජිත බලපෑම නිසා ශ්‍රී ලාංකේය ගැමි සමාජයේ පංති සම්බන්ධතා නිර්මාණයවීම පිළිබඳ නිව්ටන් ගුණසිංහ සහ කුමාරි ජයවර්ධනගේ විවාදය පිළිබඳව විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

4. 'හරිත විප්ලව හරහා ශ්‍රී ලංකාවේ ග්‍රාමීය කෘෂිකර්මාන්තය තුළ නිර්මාණය කරන ලද නවීකරණ ක්‍රියාවලිය මගින් ඇති කරන ලද්දේ ධනාත්මක බලපෑමකට වඩා සෘණාත්මක බලපෑමකි.' මෙම ප්‍රකාශය රමණී ජයතිලකගේ "The Impact of Green Revolution on the Sri Lankan Peasantry" යන ලිපිය ඇසුරින් සාකච්ඡා කරන්න.

5. තමාරා ගුණසේකර විසින් විස්තර කරන ග්‍රාමීය බල ධූරාවලියේ වෙනස්කම් අද දවසේ පවා අඛණ්ඩව වර්ධනය වෙමින් පවතී. මෙම ප්‍රකාශය සමග ඔබ එකඟද? සාකච්ඡා කරන්න.

6. වර්තමාන ග්‍රාමීය සමාජය මත ක්ෂුද්‍ර මූල්‍ය ක්‍රම විසින් ඇති කරන ලද යහපත් හා අයහපත් බලපෑම කවරේද? විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

*අ.පි.බ.*

7. 'ගෝලීයකරණ ක්‍රියාවලියේ ප්‍රතිඵලය වී ඇත්තේ ගැමි ආර්ථිකය ගෝලීය වෙළඳපොළට වඩාත් බද්ධ කිරීමයි.' මෙම ප්‍රකාශය විවේචනාත්මකව සාකච්ඡා කරන්න.

8. පහත සඳහන් මාතෘකා අතරින් **<u>දෙකක් (02)</u>** පිළිබඳව කෙටි රචනා ලියන්න.

(i) තැන්ජෝර් දිස්ත්‍රික්කයේ හරිත විප්ලවය පිළිබඳ ආන්ද්‍ර බවේල් (Andre Beteille) ගේ අදහස්.

(ii) රුසියානු ගැමි ගෘහය

(iii) ගැමියන්ගේ මතවාද

********************